# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,661 - 2010 ජූලි මස 02 වැනි සිකුරාදා - 2010.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1230 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1235 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූනි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# රජයේ නිවේදන

## 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංක ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2010 ජුනි මස 09 වැනි දින,
අංක 80. සාංචිආරච්චි වත්ත,
අධිකරණ මාවත,
කොළඹ 12,
ණය සහනාදයක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 41325 | වාසලමුනි ආරච්චිලාගේ දයාවතී මිය, දංගොල්ල, දංපිටිය, උහුමීය | හෙට්ටි පතිරන්නැහැලාගේ ශ්‍රියානි පුෂ්පලතා මිය., අංක 1ඒ/149, තලාහේන, මාළඹේ |
| (02) 41446 | වසන්තා මැදගම මිය, අංක 19/2, ශ්‍රී ධර්මාරාම පාර, වලව්වත්ත, රත්මලාන | පතිරණගේ සකිලා චන්ද්‍රකාන්ති මිය, අංක 1/21, 4 වැනි පටුමඟ, වලව්වත්ත, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන |
| (03) 41460 | අන්ද්‍රාදිගේ උපදාස සිල්වා මයා, අංක 285/36, හේගහවත්ත, දැල්තර, පිළියන්දල | පොල්කොටුවගේ සුසන්ත ජයමාල් ප්‍රනාන්දු මයා, අංක 193, කුරුඳුවත්ත පාර, දැල්තර, පිළියන්දල |
| (04) 41506 | ඉනෝකා ක්‍රිෂාන්ති මාතර ආරච්චි මිය, අංක 98/03, කිරින්ද, මධ්‍යම පුහුල්වැල්ල. | වේරදුව රට්ටම්බගේ කරුණාසේන මයා, දික්වැල්ලෙගෙදර, ආරණ්‍ය පාර, කිරින්ද, පුහුල්වැල්ල |
| (05) 41512 | මාතර අච්චිගේ ගීතා සුභාෂිණී මිය, මාරගහවත්ත, බැල්ලපිටිය, හොරණ | පැටිකිරි ආරච්චිගේ අජිත් ප්‍රියනන්ද මයා, තැපැල්හල අසල, මීවනපලාන, හොරණ |
| (06) 41514 | කුරුකුලසූරිය සවලක්කාරගේ ෆිලමිනා ගෝමස් මිය, අංක 85, බෝධිරුක්ඛාරාම පාර, නල්ලූරුව, පානදුර. | විතාන ගොඩවත්තගේ ලාල් කුමාරතිලක මයා, ගොළුකොටුව වත්ත, දිබ්බැද්ද පාර, නල්ලූරුව, පානදුර |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (07) 41520 | දොඩන්ගොඩ ආරච්චිගේ පුෂ්පලතා මිය, අංක 790/4ඒ, රුක්මලේ පාර, කොට්ටාව, පන්නිපිටිය. | උඩදෙනියේ ගෙදර නිහිල් චමින්ද කුමාර මයා, අංක 57/18, සන්තානාම්පිටිය පාර, ඇඹුල්දෙණිය, නුගේගොඩ |
| (08) 41544 | මොහමඩ් ඉක්රම් බසීර් මයා, යස්මින් මරික්කාර් මිය, අංක 9, ශාන්ත අන්තෝනි මාවත, කොළඹ 03 | සපරමාදු මහබලගේ දෝන ලීලාවතී මිය, අංක 16ඒ, ශ්‍රී වනරතනාරාම පාර, දෙහිවල |
| (09) 41562 | මහතෙල්ගේ නෙවිල් ජයන්ත පීරිස් මයා, 59/2, දෙවන පටුමග, රාවතාවත්ත, මොරටුව | විතාරණගේ දිසානායක මයා, 48, ද සොයිසා පාර, රාවතාවත්ත, මොරටුව |
| (10) 41571 | කුඩාගයලාගේ සුසන්ත අජිත් කුමාර, හේමචන්ද්‍ර මයා, අංක ඒ361, ඉහළ මානියම්ගම, අවිස්සාවේල්ල | ගල්ලන්රාල්ලාගේ ප්‍රසන්න ගම්ලත් කුමාර මයා, අංක 26/1, දකුණු අම්තිරිගල, අම්තිරිගල |
| (11) 41581 | සුද්දහැට්ට හේනයලාගේ සමන්ති නවරත්න මිය, අංක 3, "මධුසෙවන", ලිහිණිගිරියවත්ත, ජයමාවත, මහපිටිය, පොතුහැර | කන්දේදූර ආරච්චිලාගේ හසිතා සුභාෂිනී මිය, අංක 311/ඒ, කටුවිලගොල්ල, දොඩම්ගස්ලන්ද |
| (12) 41582 | කැකුලාවල ජයවර්ධන ආරියරත්න මයා, අංක 32, නඩුකාරකන්ද, අලුත්ඇලපාර, වත්තේ ගෙදර, බදුල්ල. | තිස්ස වලංගු මුදියන්සේලාගේ තිස්ස සුගත් බණ්ඩාර මයා, අංක 330/16, මහියංගන පාර, පුවක්ගොඩමුල්ල, බදුල්ල |
| (13) 41459 | කළුවිටිගොඩ විදානෙලාගේ හේමකීර්ති බණ්ඩාර මයා, අංක 286, ගොඩගම, පැල්මඩුල්ල | පල්ලෙකන්ද මනන්නලාගේ ජයරත්න මයා, නාවලකන්ද, උඩහවුපෙ, උඩහවුපෙ, කහවත්ත, |
| (14) 41542 | පුංහිගේ ආශා නිල්මිණි පීරිස් මිය, අංක 30, මහනුග සෙවන පාර, කටුකුරුන්ද, මොරටුව. | තෙල්ගේ රසික පීරිස් මයා, අංක 316, කොරලවැල්ල පාර, කොරලවැල්ල, මොරටුව |
| (15) 41557 | දොන් වසන්ත තිලකසිරි කන්නන්ගර මයා, "සන්තෝෂා", කොළ මැදිරිය, අළුත්පාර, බණ්ඩාරගම | දෝන ස්වර්ණා කන්නන්ගර මිය, අංක 219/බී, පළමු පටුමග, නිසල පෙදෙස, කළපළුවාව. රාජගිරිය |

07-163

---

**විශ්‍රාම වැටුප් සහිත තනතුරු ලෙස ප්‍රකාශයට පත් කිරීම**

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනතේ 9 වැනි වගන්තිය යටතේ පාර්ලිමේන්තු මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වැනි වගන්තිය ප්‍රකාරව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරු බව මින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2010 ජුනි මස 11 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ යේ දී ය.

## උපලේඛනය I

### *නව තනතුරු ඇති කිරීම*

| | *තනතුරු* | *ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 1. | වායු සමීකරණ හා ශීතකරණ කාර්මික | 2003.10.01 |
| 2. | විදුලි කාර්මික | 2003.10.01 |
| 3. | පුහුණු කම්කරු (විදුලි) | 2003.10.01 |
| 4. | පැස්සුම්කරු | 2003.10.01 |
| 5. | පුහුණු කම්කරු (සිවිල්) | 2003.10.01 |
| 6. | ගබඩා සහායක | 2003.10.01 |
| 7. | අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති හා කළමනාකරණ) | 2003.10.01 |
| 8. | පද්ධති ඉංජිනේරු | 2003.10.01 |
| 9. | වෙබ් සංස්කාරක | 2003.10.01 |
| 10. | පරීක්ෂක (විදුලි) | 2003.10.01 |
| 11. | අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා) | 2003.10.01 |
| 12. | ප්‍රධාන ආහාරපාන සහායක | 2004.12.08 |
| 13. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආහාරපාන හා ගෘහපාලන) | 2004.12.08 |
| 14. | නියෝජ්‍ය ආහාරපාන කළමනාකරු | 2004.12.08 |
| 15. | ආපන ශාලා කළමනාකරු | 2004.12.08 |
| 16. | ප්‍රධාන සූපවේදී | 2004.12.08 |
| 17. | සංනිවේදන ආරක්ෂණ ඉංජිනේරු | 2004.12.08 |
| 18. | වෙබ් අඩවි/ජාල පාලක | 2004.12.08 |
| 19. | පද්ධති සැළසුම්කරු | 2004.12.08 |
| 20. | දත්ත පදනම් පාලක | 2004.12.08 |
| 21. | පද්ධති පාලක | 2004.12.08 |
| 22. | සහාය කවුළු සම්බන්ධීකාරක | 2004.12.08 |
| 23. | පරිගණක තාක්ෂණවේදී | 2004.12.08 |
| 24. | තාක්ෂණ සහායක | 2004.12.08 |
| 25. | පුස්තකාල සහායක | 2005.08.31 |
| 26. | ජ්‍යෙෂ්ඨ පුස්තකාල සහායක | 2005.08.31 |
| 27. | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | 2005.08.31 |
| 28. | ලේඛන සැකසීමේ අධීක්ෂක | 2005.11.09 |
| 29. | ජ්‍යෙෂ්ඨ ලේඛන සැකසීමේ අධීක්ෂක | 2005.11.09 |
| 30. | ජ්‍යෙෂ්ඨ ලේඛන සැකසීමේ සහායක | 2005.11.09 |
| 31. | පටිගත කිරීමේ අධීක්ෂක | 2005.11.09 |
| 32. | ප්‍රධාන පරීක්ෂක (විදුලි) | 2006.02.06 |
| 33. | කාරකසභා වාර්තාකරු | 2006.03.08 |
| 34. | ප්‍රධාන පර්යේෂණ නිලධාරි | 2007.10.24 |

## උපලේඛනය II

### *තනතුරු නාමය වෙනස් කිරීම*

| | *පෙර තනතුරු නාමය* | *නව තනතුරු නාමය* | *ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|---|
| 1. | මෙහෙයුම් කළමණාකරු | අධ්‍යක්ෂ (ආහාර පාන හා ගෘහපාලන සේවා) | 2004.10.26 |
| 2. | දත්ත නිවේශන ක්‍රියාකරු | පරිගණක ක්‍රියාකරු | 2004.12.04 |
| 3. | ආරක්ෂක සහායක | ආරක්ෂක නිලධාරි | 2005.07.28 |
| 4. | පර්යේෂණ සහායක | සහකාර පර්යේෂණ නිලධාරි | 2005.08.31 |
| 5. | කණිෂ්ඨ ලිපිකරු | සහකාර පාර්ලිමේන්තු නිලධාරි | 2005.11.09 |
| 6. | පොත් බඳින්නා/යන්ත්‍ර ක්‍රියාකරු | ලේඛන සැකසීමේ සහායක | 2005.11.09 |
| 7. | එක්ස් කිරණ යන්ත්‍ර ක්‍රියාකරු | එක්ස් කිරණ පරීක්ෂක | 2006.10.18 |
| 8. | ජ්‍යෙෂ්ඨ එක්ස් කිරණ යන්ත්‍ර ක්‍රියාකරු | ජ්‍යෙෂ්ඨ එක්ස් කිරණ පරීක්ෂක | 2006.10.18 |

අංකය : ප්‍ර. නො. 11/2/35/01/2010පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2010.07.05 වැනි දින සිට 2010.07.19 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00ට සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර ලැබිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2010.07.26 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**උපලේඛනය**

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තරය* | *ලියාපදිංචි කල ඔප්පුවල විස්තරය* |
|---|---|---|
| මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "ඒ" දරන කොට්ඨාසයේ 315 වෙළුමේ 239 පත්‍ඉරුව | මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ බෝවල පිහිටි වරිපනම් අංක 76 දරන නාගරික ආදර්ශ නිවාස ක්‍රමය නමැති ඉඩමේ කොටසකට ටී. බී. සෝමදාස මිනින්දෝරු තැනගේ 1977.07.28 වැනි දින අංක 1022 දරන පිඹුරේ ප්‍රකාරව මායිම්,<br>*උතුරට* : දේපළ අංක 24,<br>*නැගෙනහිරට* : රක්ෂිත ඉඩම හා පාර,<br>*දකුණට* : එම,<br>*බස්නාහිරට* : පාරට අත්හල කොටස<br>*ප්‍රමාණය* : අ. 0, රූ. 0, පර්. 10.75 | ඒ. කේ. විජේරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2003.12.26 වැනි දින ලියා සහතික කළ අංක 4030 දරන උකස්කරය අවලංගු කිරීම |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 243/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

07-60

---

අංකය : ප්‍ර. නො. 11/2/35/07/2009පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2010.07.05 වැනි දින සිට 2010.07.19 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00ට සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති

කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2010.07.19 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**උපලේඛනය**

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තරය* | *ලියාපදිංචි කල ඔප්පුවල විස්තරය* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ "වැල්ල" දරන කොට්ඨාසයේ 57 වෙළුමේ 175-176 දරන පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ වැල්ලවත්ත පාමංකඩ ලේන්හි පිහිටි අ. 0, රූ. 0. පර්. 21.37 විශාලත්වයෙන් යුත් පිහිඹියගහවත්ත නමැති ඉඩමේ ආර්. පී. පෙරේරා මිනින්දෝරු තැනගේ 1951.09.07 දින මැන සාදන ලද අංක බී/26 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 162ඒ3 දරන කොටසට මායිම්<br>උතුරට : ලොට් 162ඒ2,<br>නැගෙනහිරට : ලොට් 162ඒ4 සහ 162ඒ7 (පාරක් සඳහා බිම් තීරය)<br>දකුණට : ලොට් 183ඒ<br>බස්නාහිරට : ලොට් 159ඒ (ඉතිරි කොටස) | 1. ජේ. එස්. පරණවිතාන ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1953 දෙසැම්බර් 16 දින ලියා සහතික කරන ලද අංක 3299 දරන විකුණුම්කර ඔප්පුව<br><br>2. ඒ. විජයසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1970 ජුනි මස 11 දින ලියා සහතික කරන ලද අංක 12136 දරන තෑගි ඔප්පුව |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 243/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

07-59

---

## තිස්සමහාරාම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය

### 1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි

1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසිවල තුන්වන රෙගුලාසි ප්‍රකාරව තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් එච්. එස්. එන්. ද ඉසඩ්. සිරිවර්ධන වන මම, පහත සඳහන් කාලය තිස්සමහාරාම වන්දනා රෙගුලාසි බල පවත්වන කාලය වශයෙන් නියම කරමි.

2010 වර්ෂයේ පොසොන් උත්සවය 2010 ජුනි 19 වැනි දින සිට 2010 ජුනි මස 26 වැනි දින දක්වා වේ. (2010 ජුනි 19 වැනි දින හා ජුනි මස 26 දින ද ඇතුලත්වය.)

එච්. එස්. එන්. ද ඉසඩ්. සිරිවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
තිස්සමහාරාමය.

2010 ජුනි 10 වැනි දින,
තිස්සමහාරාම,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-12

---

## වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### කන්දේඇල ව්‍යාපාරයේ යල කන්න රැස්වීම් වාර්තාව - 2010

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දේඇල ව්‍යාපාරයේ 2010 යල කන්නය සඳහා කන්න රැස්වීම 2010.05.13 වැනි දින අඹේවෙල වාරි මාර්ග කාර්යාලයේ දී පවත්වන ලදී. එහිදී පහත තීරණ ගන්නා ලදී :

1. වගා කරන බිම් ප්‍රමාණය : අක්කර 2300
2. වගා කරන භෝග වර්ග : අර්තාපල්/එලවලු
3. ප්‍රථම ජල මුරය නිකුත් කරන දිනය : 2010.06.15
4. ප්‍රධාන ඇල ශුද්ධ කිරීම : 2010.05.25 සිට 31 දක්වා
5. කෙත් ඇලවල් ශුද්ධ කිරීම : 2010.06.01 සිට 2010.06.10 දක්වා
6. සී සෑම, බිම් සකස් කිරීම : 2010.06.15 සිට 31 දක්වා
7. පැල සිටුවා අවසන් කිරීම : 2010.07.10ට පෙර
8. අවසන් ජල මුරය නිකුත් කිරීම : 2010.10.30 ට පෙර
9. අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය : 2010.11.15
10. ඇලවේලි ශුද්ධ නොකරන්නන්හට දඩ මුදල ලෙස වී පැලකට රු. 600ක මුදලක් අය කිරීමට තීරණය විය.

ගුණාත්මයෙන් තොර එළවළු බීජ විවිධ ආයතන විසින් වෙළඳපලට ඉදිරිපත් කිරීම නිසා ගොවීන් අපහසුතාවයට පත්වී ඇති බවට කරුණු දැක්විය. මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම්තුමා මැදිහත් වී මෙම ගැටලුවලට විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම අනවසර වක්කඩ ඉවත් කිරීමේ දිනය ලෙස ජූනි 04 යොදා ගැනීමට තීරණය විය.

කැප්පෙටිපොල බිඳුණු වැව් බැම්ම කැඩී ඇති බවත් කැප්පෙටිපොල ඩිපෝවෙන් හා ආර්ථික මධ්‍යස්ථානයෙන් ඉවත් කරන අපද්‍රව්‍ය සහිත ජලය බිඳුණු වැවට එක්වීම නිසා වැව ගොඩවීම, ජලය අපවිත්‍ර වීම වැනි ගැටලු රාශියක් ඇති වී ඇති බවත් මේ පිළිබඳව සොයා බලා ඉක්මනින් විසඳුමක් ලබා දෙන ලෙසත් ගොවි සංවිධාන නියෝජිතයන් ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2010 ජූනි මස 11 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-160

---

## වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### අඹේවෙල ව්‍යාපාරයේ යල කන්න රැස්වීම් වාර්තාව - 2010

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹේවෙල ව්‍යාපාරයේ 2010 යල කන්නය සඳහා කන්න රැස්වීම 2010.04.27 වැනි දින අබේවෙල වාරි මාර්ග කාර්යාලයේ දී පවත්වන ලදී. එහිදී පහත තීරණ ගන්නා ලදී :-

1. ඇල වේලි ශුද්ධ කිරීම අවසන් කරන දිනය : 2010.05.01
2. ප්‍රථම ජල මුරය නිකුත් කරන දිනය : 2010.05.30
3. වපුරා හෝ පැල සිටුවා අවසන් කරන දිනය : 2010.06.30
4. අවසන් ජල මුරය නිකුත් කරන දිනය : 2010.09.30
5. වගා කරන බෝග වර්ගය : මිශ්‍ර එළවළු/අර්තාපල්
6. වගා කරන බිම් ප්‍රමාණය :

   (i) තවාන ගොවි සංවිධානය : අක්කර 80
   (ii) වැලිබිස්සේවෙල ගොවි සංවිධානය : අක්කර 120
   (iii) අඹගස්දෝව ගොවි සංවිධානය : අක්කර 115
   (iv) හිඹිලියගොල්ල ගොවි සංවිධානය : අක්කර 200
   (v) තෙන්නකෝන්වෙල ගොවි සංවිධානය : අක්කර 100

* ඇලවේලි ශුද්ධ නොකරන්නන්ට මීටර් 30කට රු. 600ක මුදලක් දඩ මුදලක් ලෙස අයකර ගැනීමට තීරණය විය.

* අවශ්‍යතාවය අනුව ජල මුර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමටත් තීරණය විය.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2010 ජූනි මස 11 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-159

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පීබී 3491.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "රොසෙල් රූෆිං ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.03.19 දින සංස්ථාපිත සමාගමක් වන රොසෙල් රූෆිං ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, රොසෙල් රූෆිං ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ජූනි මස 07 වැනි දින,
කොළඹ 10
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-19

පීවී 8632.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "අමරසිංහ ස්ටෝර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2003.03.31 දින සංස්ථාපිත සමාගමක් වන අමරසිංහ ස්ටෝර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, අමරසිංහ ස්ටෝර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ජූනි මස 07 වැනි දින,
කොළඹ 10
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-18

පීවී 4590.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ඊ. ඒ. පී. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2004.01.13 වැනි දින සංස්ථාපිත සමාගමක් වන ඊ. ඒ. පී. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඊ. ඒ. පී. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ජුනි මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-17

---

පීවී 60691.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "අෂෙලී හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.07.17 වැනි දින සංස්ථාපිත සමාගමක් වන අෂෙලි හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, අෂෙලි හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ජුනි මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-15

---

පීවී 63403.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ඩී. එච්. එල්. ලොජිස්ටික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.03.12 දින සංස්ථාපිත සමාගමක් වන ඩී. එච්. එල්. ලොජිස්ටික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඩී. එච්. එල්. ලොජිස්ටික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ජුනි මස 07 වැනි දින,
කොළඹ 10
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-16

---

පීවී 449.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "හවුස් ඔෆ් හෝප්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1995.12.18 වැනි දින සංස්ථාපිත සමාගමක් වන හවුස් ඔෆ් හෝප් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, හවුස් ඔෆ් හෝප් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ජුනි මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-14

පීවී 4333.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "හේමාස් හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1998.04.21 වැනි දින සංස්ථාපිත සමාගමක් වන හේමාස් හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, හේමාස් හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 ජුනි මස 07 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-20

---

**මහජන බැංකුව - නිට්ටඹුව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2008.07.14 දිනැති අංක 13662 දරන උගස්කරය ප්‍රකාර ගෙවීම

සී/ස රන්දිව ගාමන්ට් (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව අංක පී. වී. 9136 යටතේ 2008.11.10 දින රන්දිව ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් සී/ස පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇත. යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් ලක්ෂ පහ (රු. 500,000) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2008.08.31 දින සිට වර්ෂයකට 27% බැගින් රුපියල් ලක්ෂ පහක (රු. 500,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පන්ලක්ෂය (රු. 500,000) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාට්ස් (පුද්ගලික) සමාගම විසින් එකී අංක 13662 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ හුඹුටියාව ගමේ දෙල්ගහලන්ද සහ කහටගහලන්ද නැමැති ඉඩමට බලයලත් මානක ජේ. එම්. ඩී. ටී. පැට්‍රික් රෙජිනෝල්ඩ් 2003.07.13 දින සකස් කරන ලද අංක 886-2 කේ දරන පිඹුරට අනුව ලොට් අංක 01ට මායිම් උතුරට පිඹුරු අංක 4802 ලොට් ජී නැගෙනහිරට එච්. බී. පොඩිනෝනාහාමිගේ උරුමකරුවන්ට අයත් දෙල්ගහලන්ද, දකුණට : පිඹුරු අංක 14/92 ලොට් E1 ද, බස්නාහිරට : පෞද්ගලික පාර (පිඹුරු අංක 4802 ලොට් ඩී) යන මායිම් තුල පිහිටි රූඩ් එකයි පර්චස් දහයයි දශම අට (අ. 0, රූ. 1, පර්. 10.8) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක F312/166 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන් කළ කොටස් වල මාර්ග අයිතියද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

07-171

---

**මහජන බැංකුව - නිට්ටඹුව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2006.02.14 දිනැති අංක 10892 2004.07.20 අංක 9373, 2001.03.13 අංක 5768 දරන උගස්කර ප්‍රකාර ගෙවීම්, මිහිඳුකුලසූරිය ආරච්චිගේ ජූඩ් සනෙත් පෙරේරා සහ වර්ණකුලසූරිය මහමුතුගල කංකානමලාගේ මාලනී ප්‍රනාන්දු යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් නව ලක්ෂ දාහත් දහස් හාරසිය නවයයි ශත තිස් අට (රු. 917,409.38)ක මුදලක් සහ රුපියල් එක්ලක්ෂ හත්දහස් හයසිය හැටහයයි ශත අනූ එක (රු. 107,666.91) ක මුදලක්

සහ රුපියල් දෙලක්‍ෂ අසූ දහස් නවසිය අනූ නවයයි ශත හතර (රු. 2,80,999.04) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2008.06.06 දින සිට වර්ෂයකට 16.5% බැගින් රුපියල් නව ලක්‍ෂ දාහත් දහස් හාරසිය නවයයි ශත තිස් අට (රු. 9,17,409.38) ක මුදලක් සඳහාද 2009.03.11 දින සිට වර්ෂයකට 18.25% බැගින් රුපියල් එක්ලක්‍ෂ හත් දහස් හයසිය හැටහයයි ශත අනූ එක (රු. 1,07,666.91) ක මුදලක් සහ රුපියල් දෙලක්‍ෂ අසූ දහස් නවසිය අනූ නවයයි ශත හතර (රු. 2,80,999.04) ක මුදලක් සඳහාද 2009.04.06 දින සිට වර්ෂයකට 26% බැගින්, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් නවලක්‍ෂ දාහත් දහස් හාරසිය නවයයි ශත තිස් අට (රු. 9,17,409.38) ක මුදල සහ රුපියල් එක්ලක්‍ෂ හත් දහස් හයසිය හැට හයයි ශත අනූ රක (රු. 1,07,666.91)ක මුදල සහ දෙලක්ෂ අසූ දහස් නවසිය අනූ නවයයි ශත හතර (රු. 2,80,999.04) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාට්ස් (පුද්ගලික) සමාගම විසින් එකී අංක 10892, 9373, 5768 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ හුඹුටියාව ගමේ දෙල්ගහලන්ද සහ කහටගහලන්ද නැමැති ඉඩමට බලයලත් මානක ජේ. එම්. ඩී. ටී. පැට්‍රික් රෙජිනෝල්ඩ් 2003.07.13 දින සකස් කරන ලද අංක 886-2 කේ දරන පිඹුරට අනුව ලොට් අංක 01ට මායිම් ; උතුරට : පිඹුරු අංක 4802 ලොට් ජී : නැගෙනහිරට ; එච්. බී. පොඩිනෝනාහාමිගේ උරුමකරුවන්ට අයත් දෙල්ගහලන්ද, දකුණට පිඹුරු අංක 14/92 ලොට් : F1 ද, බස්නාහිරට : පෞද්ගලික පාර (පිඹුරු අංක 4802 ලොට් ඩී) යන මායිම් තුල පිහිටි රූඩ් එකයි පර්චස් දහයයි දශම අට (අ. 0, රූ. 1, පර්. 10.8) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ් 312/166 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන් කළ කොටස් වල මාර්ග අයිතියද වේ.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

07-170

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - ගාල්ල ශාඛාව
(කලින් රුහුණ සංවර්ධන බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරනලද 1998.04.24 දින දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2008.10.09 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. ටී. එල්. නන්දන මහතා විසින් සහතික කරනලද 2004.11.08 දිනැති අංක 3724 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, උළුවිටිකේ, වලකඩවත්ත, "නිහතමානි" ලිපිනයේ පදිංචි "නෙප්චූන් සෝල්ට් පුද්ගලික සමාගම" හිමිකරුවන ඕපිටපතිරණගේ පුණ්‍යකීර්ති දේවප්‍රිය සහ දේසි නානායක්කාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දාහතරලක්ෂ දාහත්දහසක (රු. 14,17,000) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2008.07.22 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් දාහතරලක්ෂ දාහත්දහසක (රු. 14,17,000) ක මුදලක් සඳහා වර්ෂයකට 20.5% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා ද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 3724 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත්සර තුළ උළුවිටිකේ පිහිටි,

01. වලකඩවත්ත අංක 04 දරන කැබල්ල නම් වූ උතුරු-නැගෙනහිරට : හඳුන්ගෙදරවත්ත ද, උතුරු-බස්නාහිරට : මෙම ඉඩමේ අංක 03 දරන කැබැල්ල ද, දකුණු-බස්නාහිරට : ගල්දූව ද, සහ දකුණු-නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 05 දරන කැබැල්ල ද මායිම් වූ රූඩ් එකයි පර්චස් දාහතයි දශම එකයි පහ (අ. 0, රූ. 1, පර්. 17.15) ක් විශාල ඉඩම ලෙස සඳහන් වෙතත්, බලයලත් මිනින්දෝරු ඒ. වීරසිංහ මහතා විසින් වර්ෂ 1995ක් වූ මැයි මස 16 වැනි දින මැන බෙදා වෙන් කර සාදන ලද අංක 335 දරන පිඹුර ප්‍රකාරව මායිම් පහත පරිදි වේ.

ඉහත කී උළුවිටිකේ පිහිටි අංක 335 දරන පිඹුරේ නිරූපිත,

වලකඩවත්ත අංක 04 දරන කැබැල්ල නම් වූ උතුරට : මෙම ඉඩමේ අංක 03 දරන කැබැල්ල සහ කුරහකමුල්ල කුඹුර ද නැගෙනහිරට : කුරහකමුල්ල කුඹුර සහ මෙම ඉඩමේ අංක 05 දරන කැබැල්ල ද ; දකුණට : මෙම ඉඩමේ අංක 05 දරන කැබැල්ල සහ ගල්දූව වෙන් වන පාර ද, සහ බස්නාහිරට : ගල්දූව වෙන්වන පාර සහ මෙම ඉඩමේ අංක 03 දරන කැබැල්ල ද මායිම් වූ රූඩ් එකයි පර්චස් දහසයයි දශම අටයි, බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 16.80)ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද සහ ;

ඉහත කී දෙවැනි බන්ධනදායී වන මට ගාල්ල දිසා අධිකරණයේ අංක පී 9212 දරන නඩුවේ අවසාන තීන්දු ප්‍රකාශය මත හිමිව මා විසින් නිරවුල්ව භුක්ති විඳගෙන එනු ලබන බලයලත් මිනින්දෝරු ඒ. වීරසිංහ මහතා විසින් වර්ෂ 2003ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින මැන බෙදා වෙන් කර සාදන ලද අංක 771ඊ දරන පිඹුරේ නිරූපිත ;

ඉහත කී උළුවිටිකේ පිහිටි,

02. වලකඩවත්ත අංක 01 දරන කැබැල්ල නැවත බෙදා වෙන් කළ අංක 01බී දරන කැබැල්ල නැවත බෙදා වෙන්කළ අංක 1බී1 දරන කැබැල්ල නම් වූ උතුරට : මෙම ඉඩමේ අංක 04 දරන කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 1බී2 දරන කැබැල්ල ද, දකුණට : මෙම ඉඩමේ අංක 1බී2 දරන කැබැල්ල ද, සහ බස්නාහිරට : මෙම ඉඩමේ අංක 1බී2 දරන කැබැල්ල ද මායිම් වූ පර්චස් එකක් (අ. 0, රූ. 0, පර්. 1) විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේ ද වේ.

මෙම දේපළ A 655/117 A 613/04 වං 52/08 හි ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී 2007.03.23 දින ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අමරසේන ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008ක් වූ ඔක්තෝබර් මස 05 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන,
මාතර.

07-158

---

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - කඹුරුගමුව ශාඛාව
## (කලින් රුහුණ සංවර්ධන බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2009.10.28 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී :-

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඌරාපොල නරසිංහගේ චන්ද්‍රලතා මහත්මිය විසින් සහතික කරන ලද 2008.02.28 දිනැති අංක 2542 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, තෙලිජ්ජවිල, කිරිමැටිමුල්ල, අධිකාරිවිලවත්ත, "සාගර" ලිපිනයේ පදිංචි දිග්ගහ රණවක ආරච්චිගේ දයාවතී, කුමාරදාස සමරසේකර, ඉන්ද්‍රානි සමරතුංග සහ පූර්ණ රංගිකා සමරසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් අටලක්ෂ තිස්තුන්දහස් දෙසිය පනහක (රු. 8,33,250) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2009.03.27 දින සිට වර්ෂයකට 25.5% බැගින් රුපියල් අටලක්ෂ තිස්තුන්දහස් දෙසිය පනහක (රු. 8,33.250) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා ද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2542 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තර

01. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමට මානක කේ. සිරිවර්ධන මහතා මැන සම්පාදිත අංක 179/1991 හා 1991.08.08 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 331 දරන උතුරට : කැබලි අංක 315 ද, නැගෙනහිරට : අංක 279 සහ 330 ද, දකුණට : කැබලි අංක 330 ද, බටහිරට : කැබලි අංක 332 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසි දෙකක් (අ. 0, රූ. 0, පර්. 22) විශාල බිම් ප්‍රමාණය සහ එහි තුළ පිහිටි සියලු දෙය ද වේ.

මෙම ඉඩම ඩී 937/175හි ලියාපදිංචි කර ඇත.

02. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ, මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමට මානක කේ. සිරිවර්ධන මහතා මැන සම්පාදිත අංක 179/1991 හා 1991.08.08 දිනැති පිඹුර ප්‍රකාර අංක 332 දරන කැබැල්ලට මායිම්, උතුරට : කැබලි අංක 315 ද, නැගෙනහිරට : කැබලි අංක 330 සහ 331 ද, දකුණට : කැබලි අංක 333 සහ 335 ද, බටහිරට : කැබලි අංක 336 සහ 338 ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් හතරයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 34.2) විශාල බිම් ප්‍රමාණය වේ.

මෙම ඉඩම ඩී 937/176හි ලියාපදිංචි කර ඇත.

*ප්‍රවේශ මාර්ග :*

01. ඉහත මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමේ අංක 226 දරන උතුරට : කැබලි අංක 1, 2, 225, 227- 232, 3 දරන කැබලි ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 03, 225, 235, 245, 246 දරන කැබලි ද, දකුණට : කැබලි අංක 233, 235-241, 246-250, 254 ද, බටහිරට : කැබලි අංක 247-250, 254 හා ගම් සභා පාර ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි, පර්චස් දාහතරයි දශම පහක් (අ. 0, රූ. 2, පර්. 14.5) විශාල ප්‍රවේශ මාර්ගය භාවිතා කිරීමේ අයිතිය වේ.

මෙම ඉඩම ඩී 897/90හි ලියාපදිංචි කර ඇත.

02. ඉහත මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමේ අංක 235 දරන කැබැල්ලට මායිම්, උතුරට : අංක 226, 236, 258, 273, 291, 294, 298, 324, 327, 333, 335-337, 342 හා කැබලි අංක 03 සහ 04 ද, නැගෙනහිරට : අංක 236, 256, 257, 273, 276, 292, 293, 309, 312, 313, 315, 325, 326, 335-337, 341 සහ 342 ද, දකුණට : කැබලි අංක 233, 234, 274, 276, 326, 334, 343 ද, බටහිරට : කැබලි අංක 226, 233, 234, 255, 258, 274, 275, 291, 294, 298, 299, 310, 324, 334, 343 ද යන මායිම් තුළ පිහිටි අක්කර එකයි, පර්චස් හතරයි දශම එකක් (අ. 1, රූ. 0, පර්. 4.1) විශාල බිම් ප්‍රමාණය වේ.

මෙම ඉඩම ඩී 897/237හි ලියාපදිංචි කර ඇත.

03. ඉහත මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමේ අංක 241 දරන කැබැල්ලට මායිම්, උතුරට : අංක 226 ද, නැගෙනහිරට : අංක 242, 264, 284, 285, 286 සහ 301 ද, දකුණට : අංක 245 ද, බටහිරට : අංක 240, 271, 267, 265, 279, 283, 302 හා 303 ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් පහයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 35.2) විශාල බිම් ප්‍රමාණය වේ.

මෙම ඉඩම ඩී 916/239හි ලියාපදිංචි කර ඇත.

04. ඉහත මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමේ අංක 245 දරන කැබැල්ලට මායිම්, උතුරට : අංක 241, 246-251, 287, 288, 289, 301, 302, 305 ද, නැගෙනහිරට : අංක 246-251, 259, 260, 290, 295, 296 සහ 297 ද, දකුණට : අංක 242-244, 261-263, 290, 295-297, 300, 318, 319 සහ 322 ද, බටහිරට : අංක 226, 244, 261-263, 287-289, 301 සහ 279 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දහසයයි දශම දෙකක් (අ. 0, රූ. 1, පර්. 16.2) විශාල බිම් ප්‍රමාණය වේ.

මෙම ඉඩම ඩී 916/223හි ලියාපදිංචි කර ඇත.

05. ඉහත මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමේ අංක 279 දරන කැබැල්ලට මායිම් උතුරට : අංක 265, 266, 268, 269, 320 සහ 321 ද, නැගෙනහිරට : අංක 245, 280-283, 304, 305, 318, 320 සහ 322 ද, දකුණට : අංක 280-283, 278, 306-308, 316, 317, 323 සහ 328-330 ද, බටහිරට : අංක 265, 266, 268, 277, 308, 316, 317, 315, 330, 278, 306 සහ 331 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් හතයි දශම නවයක් (අ. 0, රූ. 1, පර්. 7.9) විශාල බිම් ප්‍රමාණය වේ.

මෙම ඉඩම ඩී 916/224හි ලියාපදිංචි කර ඇත.

06. ඉහත මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමේ අංක 315 දරන කැබැල්ලට මායිම්, උතුරට : අංක 313, 314 සහ 317 ද, නැගෙනහිරට : අංක 279, 314 සහ 317 ද, දකුණට : අංක 331, 332, 338-341 ද, බටහිරට : අංක 235, 232, 238 සහ 239 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසි එකයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 21.4) විශාල බිම් ප්‍රමාණය වේ.

මෙම ඉඩම ඩී 916/240 හි ලියාපදිංචි කර ඇත.

07. ඉහත මාලිම්බඩ පිහිටි අධිකාරිවිලවත්ත නමැති ඉඩමේ අංක 322 දරන කැබැල්ලට මායිම් උතුරට : අංක 226, 245, 254, 297 සහ 300 ද, නැගෙනහිරට : අංක 254, 255, 258, 291, 294, 298-300 සහ 323 ද, දකුණට: අංක 252, 279, 323 සහ 298, 299 ද, බටහිරට : අංක 250, 252, 259, 260, 279, 290, 295 සහ 297, 300, 319 සහ 321 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් එකොළහයි දශම දෙකක් (අ. 0, රූ. 1, පර්. 11.2) විශාල බිම් ප්‍රමාණය වේ.

මෙම ඉඩම ඩී 916/241 හි ලියාපදිංචි කර ඇත.

ඉහත ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී937/175, 176 වංවල 17/166 හි 2007.07.23 දින ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009ක් වූ ඔක්තෝබර් මස 28 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන,
මාතර.

07-157

## ලංකා බැංකුව - කුලියාපිටිය ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.09.17 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ටී. බී. සී. එදිරිසිංහ විසින් සහතික කරන ලද 2004.10.20 දිනැති අංක 11225 දරන උකස් බැඳුම්කරය හා 2006.03.23 දිනැති අංක 11635 දරන උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2009.07.24 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් දසලක්ෂ තිස්එක් දහස් හයසිය හැත්තෑවයි ශත හැත්තෑතුනක (රු. 10,31,670.73) මුදලක් සමග රුපියල් අටලක්ෂ හැත්තෑහත් දහස් දෙසිය තුනයි ශත තුනක (රු. 8,77,203.03) මුදලක් මත වසරකට සියයට විසි අට (28%) බැගින් පොළියක් ද, 2009.07.25 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක්, කුලියාපිටිය, පල්ලෙපිටිය, විජය මාවත, අංක 21හි පදිංචි නැකත් ගෙදර ජනක සුදත් අරුණලාල් මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. ඉහත "1" හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ඉහත කී අංක 11225 සහ 11635 දරන උකස් බැඳුම්කර වලින් ආවරණය වන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට හලාවත, රදගුරු මාවත, අංක 4ඩී හි පදිංචි වෙන්දේසිකාර ඩී. එල්. ජේ. නිශ්ශංක මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, යටිකහ කෝරළේ දකුණ, කුලියාපිටිය නගර සභා සීමාව තුළ පල්ලපිටිය පිහිටි තිඹිරිගහමුලවත්තෙහි බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් සාදන ලද 2001.10.25 දිනැති අංක 4291A දරන පිඹුරෙහි නිරූපිත ඉඩම් කැබැල්ල ; උතුරට : විජය මාවත ද, නැගෙනහිරට : විජය මාවතේ, වරිපනම් අංක 15 දරන ඩී. එම්. දිසානායකගේ ඉඩම ද, දකුණට : කුලියාපිටිය ග්‍රාම මායිම ද, බස්නාහිරට : විජය මාවතේ, වරිපනම් අංක 21 දරන එම්. එන්. පුංචිමැණිකේ උරුමකම් කියන ඉඩම ද, මායිම්ව රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) (හෙක්ටයාර් 0.20234) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

ඉහත විස්තර කළ ඉඩම් කොටස කුලියාපිටිය නගර සභා සීමාවේ, එකී පල්ලපිටියෙහි පිහිටි විජය මාවතේ වරිපනම් අංක 31 දරන තිඹිරිගහමුලවත්ත නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු බී. ඒ. එස්. ෆිගරාඩෝ විසින් සාදන ලද 1961.10.30 දිනැති අංක 31 දරන පිඹුරෙහි ලොට් B ලෙස දක්වා ඇති, උතුරට : න. ස. පාර ද, නැගෙනහිරට : ටී. බී. දිසානායකගේ ඉඩම ද, දකුණට : කුලියාපිටිය ග්‍රාම සීමාව ද, බස්නාහිරට: ටී. කාසිම්උම්මා උරුමකම් කියන ඉඩම ද, මායිම්ව රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන ඉඩම් කැබැල්ලෙන් නැවත මැනීමකි. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J109/08 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අයි. එම්. එල්. කරුණාතිලක,
කළමනාකරු.

ලංකා බැංකුව,
කුලියාපිටිය ශාඛාව.

07-186

### මහජන බැංකුව - පේරාදෙණිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් දේවනාරායන ගෙදර ශ්‍යාමා ගීතාංජලී දයාරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2008.03.18 දිනැති අංක 1169 සහ 2008.09.25 දින සහතික කරන ලද අංක 1215 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම් කිරීම මහනුවර, මුල්ගම්පල, පේරාදෙණිය පාර, අංක 628/2ඒ දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි (දැනට 1/4, සරසවි උයන ගුඩ්ෂෙඩ් පාර, සරසවි උයන, පේරාදෙණිය) සඳුනි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් (පුද්ගලික) සමාගම යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 1169 දරන උකස්කරය යටතේ දැනට රුපියල් තිස්අට ලක්ෂ පනස්නව දහස් හයසිය විසිනවයයි ශත අනූතුනක (රු. 38,59,629.93) මුදලක් ද, අංක 1215 දරන උකස්කරය යටතේ දැනට රුපියල් තිස්ලක්ෂ තිස්තුන් දහස් දෙසිය අනූපහයි ශත අසූඅටක (රු. 30,33,295.88) මුදලක් බැංකුවට අයවීමට ඇති බැවින් එම මුදල් සහ එකී රුපියල් තිස්අට ලක්ෂ පනස්නව දහස් හයසිය විසිනවයයි ශත අනූතුනක (රු. 38,59,629.93) මුදල සඳහා 2010.01.31 වැනි දින සිට වර්ෂයකට 25% බැගින් සහ රුපියල් තිස්ලක්ෂ තිස්තුන් දහස් දෙසිය අනූපහයි ශත අසූඅටක (රු. 30,33,295.88) මුදල සඳහා 2009.12.06 වැනි දින සිට වර්ෂයකට 20% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද, මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් දේවනාරායන ගෙදර ශ්‍යාමා ගීතාංජලී දයාරත්න මහත්මිය විසින් 2008.03.18 වැනි දින සහතික කළ අංක 1169 දරන උකස්කරය සහ 2008.09.25 වැනි දින සහතික කළ අංක 1215 දරන උකස්කරය යටතේ බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 මහජන බැංකු පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුළුගම්මන සියපත්තුවේ, බොකලවෙල පිහිටි වටකලදෙණිය, මෙගොඩහේන නොහොත් වත්ත නමැති වී පැල් දෙකක් (02) විශාල උතුරට : කටුඉඹුල්ගහ සහ පතහෙන් උඩ ද, නැගෙනහිරට : වෙල ද, දකුණට : වෙල ද, බස්නාහිරට : මී අත්තාවැටේතැන්නේ වැට සහ ළිඳෙන් උඩ ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම හා ඊට අයත් ගහකොළ-පළතුරු ආදී සෑම සියළු දේ ද සමග වේ.

ඉහත ඉඩමට මෑතක දී අඳින ලද නව පිඹුරක් අනුව පහත පරිදි ද විස්තර වේ :-

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුළුගම්මන සිය පත්තුවේ, බොකලවෙල පිහිටි වටකලදෙණිය, මොගොඩහේන නොහොත් වත්ත නමැති ඉඩමට ඒ. ආර්. ටී. ගුරුසිංහ අවසරලත් මිනින්දෝරුතැන විසින් 2007.07.01 වැනි දින මැන සාදන ලද අංක 3280 දරන පිඹුරේ (එකී මිනින්දෝරු තැනගේ එම දින දරන අංක 3274 පිඹුරේ ලොට් අංක 01 සහ 02 යන එකට යාව පිහිටි ඉඩම) ලොට් 01 වන ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් හතරයි දශම බින්දුවයි දෙකක් (අ. 1, රූ. 2, පර්. 4.02)ක් විශාල උතුරට සහ උතුරු-නැගෙනහිරට : කටුඉඹුල්ගහ සහ කුඹුර ද, දකුණට සහ දකුණු-නැගෙනහිරට : කටුගස්තොට වත්ත කොළණිය ද, බස්නාහිරට : මී අත්තාවෙල හේන, හපුගොඩ සිට රණවන මැදවල දක්වා දිවෙන ප්‍රධාන පාරේ සිට ඉඩමට එන පොදු පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම, ගොඩනැගිලි සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේ ද සමග වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 810/207 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.

07-169

---

### මහජන බැංකුව - හාලිඇල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනා සම්මුතිය

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.22 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

මහජන බැංකුව වෙනුවෙන් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර යන අය විසින් ලියා සහතික කරන ලද අංක 3347 හා 2005.08.29 වැනි දින දරන උකස් බැඳුම්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අධිකාරි ජයසුන්දර මුදියන්සේලාගේ චන්ද්‍රසිරි සහ විජේසිංහ මුදියන්සේලාගේ මාලා ජයන්තිනි මයිකල් යන අය විසින් පැහැර හැර ඇති බැවින් එකී බැඳුම්කර අංක 3347 මත දැනට රුපියල් දහඅට ලක්ෂ විසිතුන්දහස් හයසිය හැටහයයි ශත පනහක (රු. 18,23,666.50) මුදලක් එකී මහජන බැංකුවට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එබැවින් එකී රුපියල් දහඅට ලක්ෂ විසිතුන්දහස් හයසිය හැටහයයි ශත පනහක (රු. 18,23,666.50) එකී මුදල ද, ඒ සමග රුපියල් දහඅට ලක්ෂ විසිතුන්දහස් හයසිය හැටහයයි ශත පනහක (රු. 18,23,666.50) එකී මුදල මත 2008.04.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට දහසයයි දශම පහ (16.5%) බැගින් තවදුරටත් වූ පොළිය ද, ඒ සමග එකී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් හා ගාස්තු ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු එකී මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. ජයතිලක යන අය විසින් එකී අංක 3347 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තර

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, කුඹල්වෙල කෝරළයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හල්පේ පිහිටා ඇති

අවසරලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. මුණසිංහ විසින් සාදන ලද 1987.03.30 දිනැති අංක 2035 පිඹුරේ නිරූපණය කර ඇති "ගොන්තවලන්තැන්න" හෙවත් "හෝන්පොලගොඩහේන" යනුවෙන් හැඳින්වෙන බෙදා වෙන් කර නිර්ණය කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම කොටසක්, නැගෙනහිරට : JEDB දෙමෝදර ගෲප් සහ කැලෑ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම, දකුණට : මෙම ඉඩමේම කොටසක්, බස්නාහිරට : ටී. තංගවේලු අයිතිවාසිකම් කියන කුඹුර යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) වපසරියක් ඇති ඉඩම වැව්ලි ඇතුළු එහි පිහිටි සෑම සියළුදේත් සමග වේ. මෙය බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J90/321 යටතේ ලියාපදිංචි කර ඇත.

මෑතක දී වූ මැනීමක දී පෙර කී ඉඩම් කොටස පහත දැක්වෙන ලෙසත් විස්තර වී ඇත.

පෙර කී බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හල්පේ පිහිටි "ගොන්තවලන්තැන්න" හෙවත් "හෝන්පොලගොඩහේන" යනුවෙන් හැඳින්වෙන ඉඩමට අවසර ලත් මානක ජී. සමරක්කොඩි සෑදූ 2001.04.10 දිනැති අංක 3958 පිඹුරේ නිරූපණය කර ඇති ලොට් 01 ලෙස සලකුණු කරන ලද බෙදා වෙන්කර නිර්ණය කර ඇති එකී ලොට් 1 ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම කොටසක්, නැගෙනහිරට : දෙමෝදර වත්ත (පෞද්ගලික), දකුණට : මෙම ඉඩමේම කොටසක් සහ පිවිසුම් මාර්ගය, බස්නාහිරට : ටී. තංගවේලු අයිතිය කියන කුඹුර යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) වපසරියක් ඇති ඉඩම වැව්ලි ඇතුළු එහි පිහිටි සෑම සියළු දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු,
බදුල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල.

07-168

---

**මහජන බැංකුව - මාතලේ ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වැනි වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වැනි වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර මහත්මිය විසින් මහජන බැංකුව නමට ලියාසහතික කරන ලද 2009.06.02 දිනැති අංක 500 දරන උකස්කරය ප්‍රකාර අයවියයුතු ගෙවීම්, රණසිංහ ආරච්චිලාගේ දොන් ජයවික්‍රම සහ රණසිංහ ආරච්චිලාගේ දොන් ජයරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින්ද, එකී උකස්කරය යටතේ රුපියල් නවලක්ෂ අසූ තුන් දහස් තුන්සිය තිස් තුනයි ශත තිස් හතර (රු. 9,83,333.34) ක මුදලක් දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද එකී රුපියල් නව ලක්ෂ අසූතුන්දහස් තුන්සිය තිස් තුනයි ශත තිස් හතර (රු. 9,83,333.34) ක මුදල මත 2010.01.29 දින සිට වෙන්දේසි දිනය දක්වා අවුරුද්දට සියයට විසිපහයි දශම පහ (25.5%) බැගින් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (එල් 29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග ඉන් අනතුරුව යම්කිසි ගෙවීම් කිසිවක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් නව ලක්ෂ අසූතුන්දහස් තුන්සිය තිස්තුනයි ශත තිස් හතර (රු. 9,83,333.34) ක මුදල අයකර ගැනීම සඳහා මහනුවර ෂොක්මන් සහ සමරවික්‍රම බලයලත් වෙන්දේසිකාර මහතා විසින් එකී අංක 500 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර**

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මහ නගර සභා සීමාව තුළ අළුවිහාරේ පිහිටි දාවිචියායේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු මහතා විසින් 1968.10.25 දින මැන සාදන ලද අංක 864 දරන පිඹුරුපත පරිදි බෙදා වෙන්කල ලොට් 01 දරන කොටසට මායිම් ; උතුරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 02 දරන කොටසද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 10 දරන කොටසද, දකුණට: එල්. එච්. ෆර්ඩිනැන්ස් බලයලත් මිනින්දෝරු මහතාගේ 1934.09.30 දින හා අංක 20 දරන පිඹුරේ ලොට් ඩී දරන කොටස, සහ බස්නාහිරට ප්‍රධාන පාරද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් නවයයි දශම දෙකක් (අක්. 0, රූඩ්. 0, පර්. 9.2) ක් විශාල ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ගහකොල පළතුරු ආදී සියලු දේත්, වේ.

ඉහත ඉඩම නව මිණුමක් අනුව පහත පරිදි විස්තර වේ.

මධ්‍යම පලාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මහ නගර සභා සීමාව තුළ අළුවිහාරේ පිහිටි දාවිචියායේ වත්ත හෙවත් දාවිචියා වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. වී. සිරිසුමන මහතා විසින් 2000.05.12 දින මැන සකස් කරන ලද අංක 1186 දරන පිඹුරුපත පරිදි බෙදා වෙන්කල ලොට් 01 දරන කොටසට මායිම් ; උතුරට : ආබ්දීන් හිමිකම් කියන ඉඩමද නැගෙනහිරට : විතානආරච්චි හිමිකම් කියන ඉඩමද, දකුණට : ඒ. එම්. කේ. මරික්කාර් හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට : මාතලේ දඹුල්ල ප්‍රධාන පාරද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් නවයයි දශම දෙකක් (අක්. 0, රූඩ්. 0, පර්. 9.2) ක් විශාල ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි ගහකොල පළතුරු ආදී සියලු දේත්, වේ.

මෙම දේපල මාතලේ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඒ 132/6 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ප්‍රාදේශීය කළමනාකාර - මාතලේ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 02, මීවත්තකුඹුර පාර
මාතලේ.

07-172

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකුව මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 04 වැනි වගන්තිය යටතේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ දෙසැම්බර් මස 16 වැනි දින පැවැත් වූ රැස්වීමක දී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (කලින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්) (බැංකුව) නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. පී. එන්. සෙනවිරත්න (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2004.11.03 දිනැති අංක 34 සහ 2004.12.23 දිනැති අංක 54 දරන උකස් බැඳුම්කරයන් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. ජයවර්ධන (මහත්මිය) විසින් සහතික කරන ලද 2006.08.31 වැනි දිනැති අංක 233 දරන පවරා දීමේ ඔප්පුව යන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මහනුවර පදිංචි පණ්ඩිත තිස්සංක තිලකරත්න (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින්ද,

තවද 2009 ක් වූ නොවැම්බර් මස 30 වැනි දිනට යථෝක්ත බැඳුම්කරයන් යටතේ බැංකුවට රුපියල් හත් ලක්‍ෂ හතලිස් තුන්දහස් නමසිය තුන (රු. 7,43,903.00)ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින්ද,

1995 අංක 24 දරන (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ බැංකුවෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් හත්ලක්‍ෂ හතලිස් තුන් දහස් නමසිය තුන (රු. 7,43,903.00) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වැනි විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2009ක් වූ දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා,

(i) එකී අංක 34 දරන බැඳුම්කරය යටතේ මුළු මුදල වූ රුපියල් දෙලක්‍ෂ විසි හය දහස් හයසිය හය (රු. 2,26,606.00) ක මුදල මත වසරකට සියයට දොළහයි දශම පහ (12.5%)ක පොළියද,

(ii) එකී අංක 54 දරන බැඳුම්කරය යටතේ මුළු මුදල වූ රුපියල් පන්ලක්‍ෂ හත් දහස් එකසිය අනූඑක (රු. 5,07,191.00) ක මුදල මත වසරකට සියයට දහතුන (13%) ක පොළියද,

ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 4 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරයන් මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

#### ඉහත සඳහන් උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පල කෝරලේ කෙන්ගල්ලේ පිහිටි වලව්වේවත්ත හෙවත් අලිඅඹගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ආර්. එල්. කේ. ජයසුන්දර විසින් සාදන ලද 2003.10.11 දිනැති ජේ1883 දරන පිඹුරෙහි ලොට් 10 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන්කල ඉඩම් කොටස, උතුරු නැගෙනහිරට : පිඹුරු අංක ජේ1856හි ලොට් 3 සහ 4 වෙන් කරන කාණුව සඳහා වෙන් කර ඇති ලොට් 27න් ද, දකුණට : ලොට් 9න්ද, බටහිරට ප්‍රවේශය සඳහා වූ එම ඉඩමේම ලොට් 13න් ද, උතුරු බටහිරට : එම පිඹුරේම ලොට් 12න් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 8.2) ක් වන අතර එහි පිහිටි අනෙකුත් සියළුම දේ සහ මාර්ග අයිතිය සහ මෙම පිඹුරේ පෙන්වා ඇති ලොට් 13 දරන ප්‍රවේශ මාර්ගය සහ පිඹුරු අංක ජේ1856 හි දක්වා ඇති ලොට් 2 මතින් පොදුවේ භාවිතා කිරීමට හැකි ජල, විදුලිබල, දුරකථන, ජලාපවහන සහ මළාපවහන මාර්ගද ඇතුළුව. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයයේ ඊ746/231 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත. එකී අංක 34 සහ 54 දරන උකස් බැඳුම්කරයන්හි 3 වැනි උපලේඛනයේ දක්වා ඇති මාර්ග අයිතිය ද ඇතුළුව.

අධ්‍යක්‍ෂ/ප්‍රධාන විධායක නිලධාරී,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

07-39

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1960013600.
ණය ගිණුම් අංකය : 527813, 527818.

දොස්තර ගිහාන් නිරෝෂන් ජයවර්ධන සහ දොන් උපසේන රූපසිංහ ජයවර්ධන.

2010 මාර්තු මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස සම්මත කරන ලදී :

මතුගම ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. එන්. ජී. සිරිවර්ධන විසින් 2008 මැයි මස 30 වැනි සහතික කරන ලද අංක 565 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ (මෙහි 1 වැනි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය) බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගිහාන් නිරෝෂන් ජයවර්ධන සහ දොන් උපසේන රූපසිංහ ජයවර්ධන ණයකරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් ද,

මතුගම ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. එන්. ජී. සිරිවර්ධන විසින් 2008 මැයි මස 30 වැනි දින සහතික කරන ලද අංක 566 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ (මෙහි 2 වැනි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍ර) බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගිහාන් නිරෝෂන් ජයවර්ධන සහ දොන් උපසේන රූපසිංහ ජයවර්ධන ණයකරුවන් හැටියට ද, පැහැර හැර ඇති හෙයින් ද,

මතුගම ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. එන්. ජී. සිරිවර්ධන විසින් 2008 මැයි මස 30 වැනි දින සහතික කරන ලද අංක 567 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ (මෙහි 3 වැනි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍ර) බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "සම්රෝ ටී ෆැක්ටරි" යන නාමයෙන් සහ විලාශයෙන් තනි අයිතිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන ගිහාන් නිරෝෂන් ජයවර්ධන ණයකරු හැටියට ද, සහ

මතුගම ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. එන්. ජී. ජයවර්ධන විසින් 2008 මැයි මස 30 වැනි දින සහතික කරන ලද අංක 568 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගිහාන් නිරෝෂන් ජයවර්ධන සහ දොන් උපසේන රූපසිංහ ජයවර්ධන ණයකරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් ද, සහ

2008 නොවැම්බර් මස 17 වැනි දින දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ (මෙහි 4 වැනි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති යන්ත්‍රෝපකරණ) බැඳුම්කර 2009/001 යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගිහාන් නිරෝෂන් ජයවර්ධන සහ දොන් උපසේන රූපසිංහ ජයවර්ධන පැහැර හැර ඇති හෙයින් ද,

දැන් එකී බැඳුම්කර යටතේ රුපියල් හැටහය මිලියන නවසිය හතර දහස් අටසිය දහයයි ශත අනූනවයක (රු. 66,904,810.99) මුදලක් 2010 මාර්තු මස 03 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතු ඇති හෙයින් ද, එකී රුපියල් හැට හය මිලියන නවසිය හතර දහස් අටසිය දහයයි ශත අනූනවයක (රු. 6,69,04,810.99) මුදල අයකර ගැනීම සඳහා 2010 මාර්තු මස 04 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,34,00,000ක මුදල මත 19% වැඩිදුර වාර්ෂික පොළියක් සහ රු. 30,72,454.13ක මුදල මත 22% වැඩිදුර වාර්ෂික පොළියක් ද, සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද දරන ලද වෙනත් වියදම් ද, වෙතොත් ඒවා ද, මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද, අඩුකොට මෙහි 1, 2 සහ 3 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති එකී අංක 565, 566, 567 සහ 568 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ දේපළ සහ පරිශ්‍ර ද මෙහි 4 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති එකී අංක 2009/001 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇති යන්ත්‍රෝපකරණ ද කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවන උපලේඛනය

අනුග්‍රහලත් මිනින්දෝරු එම්. එල්. එම්. ෂෙරිෆ් විසින් 1984 අගෝස්තු මස 05 වැනි දින සාදන ලද අංක 2692/84 දරන පිඹුරෙහි දැක්වෙන මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කඩියන්ලෙන ග්‍රාමයේ පිහිටි මස්සබිල්ල වතුයායේ ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන් සහ එහි පවත්නා අනෙකුත් සියලුදේත් සමග බෙදා වෙන් කර ලොට් 1B ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : පිඹුරු පත් P. Plan Maha 1275හි සඳහන් ලොට් 1හි ඉතිරි කොටසින් ද, නැගෙනහිරට : ලොට් 1A සහ දකුණට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් වෙස්ට්හෝල් වතුයායේ ඉඩම් ද, සහ බස්නාහිරට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් ඉඩමේ ලොට් 2 ද යන මායිම් තුළ පිඹුරු අංක 2692/84ට අනුව අක්කර විස්සක් (අ. 20, රූ. 0, පර්. 0) විශාල ඉඩම ගම්පළ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ 48/99 දරන වෙළුමේ/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

අනුග්‍රහලත් මිනින්දෝරු පී. ඥාණප්‍රකාසම් විසින් 1985.10.29 වැනි දින සාදන ලද අංක 1285 දරන පිඹුරෙහි දැක්වෙන මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ උඩ බුලත්ගම පස්බාගේ කෝරළේ, කඩියෙන්ලෙන ග්‍රාමයේ පිහිටි ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන් සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද මස්සබිල්ල වතුයාය ට මායිම්, උතුරට : එස්. පෙරියසාමි සහ තවත් අයගේ මස්සබිල්ල වතුයාගේ කොටසකින් ද, නැගෙනහිරට : ඩී යූ. ආර්. ජයවර්ධන සහ එන්. පී. සමරතුංග යන අයගේ (පෙර මස්සබිල්ල වතුයායේ කොටසක්) ග්‍රීන්ලන්ඩ් වතුයාය ද සහ දකුණට : වෙස්ට්හෝල් වත්ත, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ බස්නාහිරට : හන්ගරන් ඔය ද යන මායිම් තුළ අංක 1285 දරන පිඹුරට අනුව අක්කර විසි හයක් (අ. 26, රූ. 0, පර්. 0) විශාල ඉඩම ගම්පළ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ A48/98 වෙළුමේ/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

1. අනුග්‍රහලත් මිනින්දෝරු ඒ. ඉලන්කෝන් විසින් 2007 අගෝස්තු මස 19 වැනි දින සාදන ලද පිඹුරු අංක 226හි දැක්වෙන (අනුග්‍රහලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1968 ජූලි මස 01 වැනි දින සාදන ලද පිඹුරු අංක 824හි නැවත මිණුම් කිරීමක් සහ ලොට් 02 සිට 12 දක්වා ද, 14A සහ 15 දක්වා ද යන ඒකාබද්ධ කරන ලද ලොට් දහතුනක් උප කොට්ඨාසවලට බෙදීමක් ලෙස දැක්වෙන) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළේ, දකුණු මහ පත්තුවේ කෙව්ටියාගල පිහිටි පන්නරගොඩහේන සහ පල්ලෙවිලදෙනිය කියන ඉඩමේ ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන්, පස්බිම සහ එහි පවත්නා අනෙකුත් සියළු දේත් සමග බෙදා වෙන් කර ලොට් A ලෙස සළකුණු කර ඇති බිම් කොටසටම මායිම්, උතුරට : මෙගොඩවත්ත ද, නැගෙනහිරට : පිඹුරු අංක 824හි ලොට් 14A 1 සහ 13 සහ T. P. 80929 හි ඉඩම ද, දකුණට : T. P. 80929 සහ T. P. 196223 හි ඉඩම් ද සහ බස්නාහිරට : T. P. 196223හි ඉඩම සහ එකී පිඹුරෙහි ලොට් B ද යන මායිම් තුළ එකී පිඹුරු අංක 226ට අනුව අක්කර අටක් (අ. 8, රූ. 0, පර්. 0) හෝ හෙක්ටයාර් 3.2374ක් විශාල ඉඩම මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E347/49 වෙළුමේ/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. අනුග්‍රහලත් මිනින්දෝරු ඒ. ඉලන්කොන් විසින් 2007 අගෝස්තු මස 19 වැනි දින සාදන ලද පිඹුරු අංක 226හි දැක්වෙන (අනුග්‍රහලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1968 ජූලි මස 01 වැනි දින සාදන ලද පිඹුරු අංක 824හි නැවත මිණුම් කිරීමක් සහ ලොට් 02 සහ 12 දක්වා ද, 14A සහ 15 දක්වා ද යන ඒකාබද්ධ කරන ලද ලොට් දහතුනක් උප කොට්ඨාසවලට බෙදීමක් ලෙස දැක්වෙන) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළේ, දකුණු මහපත්තුවේ, කෙව්ටියාගල පිහිටි පන්නරගොඩහේන සහ පල්ලෙවිලදෙනිය කියන ඉඩමේ ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන්, පස්බිම් සහ එහි පවත්නා අනෙකුත් සියළු දේත් සමග බෙදා වෙන් කර ලොට් B ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරු අංක 226හි සඳහන් ලොට් A ද, නැගෙනහිරට : එකී පිඹුරු අංක 226හි සඳහන් ලොට් A ද, දකුණට : එකී පිඹුරු අංක 226හි සඳහන් ලොට් C ද සහ බස්නාහිරට : එකී පිඹුරු අංක 226හි සහන් ලොට් C ද යන මායිම් තුළ එකී පිඹුරු අංක 226ට අනුව අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් තිස්එකයි දශම එකක් (අ. 1, රූ. 2, පර්. 31.1) හෝ හෙක්ටයාර් 0.6858 ක් විශාල ඉඩම මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E347/50 වෙළුමේ/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

3. අනුග්‍රහලත් මිනින්දෝරු ඒ. ඉලන්කෝන් විසින් 2007 අගෝස්තු මස 19 වැනි දින සාදන ලද අංක 226 දරන පිඹුරෙහි දැක්වෙන (අනුග්‍රහලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1968 ජූලි මස 01 වැනි දින සාදන ලද පිඹුරු අංක 824හි නැවත මිණුම් කිරීමක් සහ ලොට් 02 සිට 12 දක්වා ද, 14A සහ 15 දක්වා ද යන ඒකාබද්ධ කරන ලද ලොට් දහතුනක් උප කොට්ඨාසවලට බෙදීමක් ලෙස දැක්වෙන) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළේ, දකුණු මහපත්තුවේ,

කෙවිටියාගල පිහිටි පන්නරගොඩහේන සහ පල්ලෙවිලදෙනිය කියන ඉඩමේ ගොඩනැගිලි, වෘක්ෂයන්, වගාවන්, පස්බිම සහ එහි පවත්නා අනෙකුත් සියළු දේත් සමග බෙදා වෙන් කර ලොට් D ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : T. P. 35410 හි සඳහන් ඉඩම ද, නැගෙනහිරට : එකී පිඹුරු අංක 226හි සඳහන් ලොට් C ද, දකුණට : එකී පිඹුරු අංක 226හි සඳහන් ලොට් C ද, සහ ජම්බුගහ කුඹුර ද, බස්නාහිරට : ජම්බුගහ කුඹුර සහ T. P. 35410 හි සඳහන් ඉඩම ද යන මායිම් තුළ එකී පිඹුරු අංක 226ට අනුව රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) හෝ හෙක්ටයාර් 0.1011ක් විශාල ඉඩම මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E347/51 වෙළුමේ/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

මෙලෙස විස්තර කරනු ලබන මාර්ග වෙන් කර තුළින්, උඩින් සහ ඔස්සේ යාමේ අයිතිය ද එක්ව ය.

1. අනුග්‍රහලත් මිනින්දෝරු ඒ. ඉලන්කෝන් විසින් 2007 අගෝස්තු මස 19 වැනි දින සාදන ලද පිඹුරු අංක 226 දරන පිඹුරෙහි දැක්වෙන (අනුග්‍රහලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1968 ජූලි මස 01 වැනි දින සාදන ලද පිඹුරු අංක 824හි නැවත මිණුම් කිරීමක් සහ ලොට් 02 සිට 12 දක්වා ද, 14A සහ 15 දක්වා ද යන ඒකාබද්ධ කරන ලද ලොට් 13ක් උප කොට්ඨාසවලට බෙදීමක් ලෙස දැක්වෙන) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළේ, දකුණු මහපත්තුවේ, කෙවිටියාගල පිහිටි පන්නරගොඩහේන සහ පල්ලෙවිලදෙනිය කියන ඉඩමේ බෙදා වෙන් කර ලොට් C (අඩි 16ක් පළල පාරක් සඳහා වෙන් කරය) ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරටඃ එකී පිඹුරු අංක 226හි සඳහන් ලොට් A සහ B ද, දකුණට : එකී පිඹුරු අංක 226 හි සඳහන් ලොට් A සහ T. P. 196223හි සඳහන් ඉඩම ද සහ බස්නාහිරට : T. P. 196223හි සඳහන් ඉඩම ද. ජම්බුගහ කුඹුර සහ එකී පිඹුරු අංක 226හි සඳහන් ලොට් D ද, යන මායිම් තුළ එකී පිඹුරු අංක 226ට අනුව රූඩ් එකයි පර්චස් විසිහතයි දශම නවයක් (අ. 0, රූ. 1, පර්. 27.9) හෝ හෙක්ටයාර් 0.1717ක් විශාල ඉඩම මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E347/52 වෙළුමේ/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. අනුග්‍රහලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1968 ජූලි මස 01 වැනි දින සාදන ලද අංක 824 දරන පිඹුරෙහි දැක්වෙන බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරළේ, දකුණු මහපත්තුවේ, කෙවිටියාගල පිහිටි පන්නරගොඩහේන සහ පල්ලෙවිලදෙනිය කියන ඉඩමේ බෙදා වෙන්කර ලොට් 14A (පාරක් සඳහා වෙන්කරය) ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : අල්ලිසා සහ එස්. බී. සරනේරිස් සහ තවත් අයගේ ඉඩම ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එම ඉඩමේ ලොට් 1 ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 13 ද යන මායිම් තුළ එකී පිඹුරු අංක 824ට අනුව පර්චස් එකොළහක් (අ. 0. රූ. 0, පර්. 11) විශාල ඉඩම මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E347/53 වෙළුමේ/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

**හතරවන උපලේඛනය**

| *මාදිලිය* | *විස්තරය* |
|---|---|
| නන්ටා 7144T පෙළ තේ පාට තෝරන්නා | බකට් එලවේට(ර්) ෆීඩ් හොප(ර්), තෘ කන්වේය(ර්) සහ නියමිත අමතර කොටස් ද සමග ය. |

ආර් ආර්. දූනුවිල,
සමාගම් ලේකම්.

07-175

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2010** | | | |
| ජූලි | 2010.07.02 | සිකුරාදා | 2010.06.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.09 | සිකුරාදා | 2010.06.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.07.16 | සිකුරාදා | 2010.07.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.23 | සිකුරාදා | 2010.07.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.30 | සිකුරාදා | 2010.07.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2010.08.06 | සිකුරාදා | 2010.07.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.13 | සිකුරාදා | 2010.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.20 | සිකුරාදා | 2010.08.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.27 | සිකුරාදා | 2010.08.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2010.09.03 | සිකුරාදා | 2010.08.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.09 | බ්‍රහස්පතින්දා | 2010.08.27 | බදාදා | දහවල් | 12.00 |
| | 2010.09.17 | සිකුරාදා | 2010.09.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.24 | සිකුරාදා | 2010.09.09 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.